---

**පුත්තලම නගර සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන, 2013 සැප්තැම්බර් 11 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූනි 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දැක්වෙන අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පුත්තලම නගර සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම්**

නගර සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් ද, පරිත්‍යාග වශයෙන් ලද කි.වො.14.8ක ධාරිතාවයෙන් යුතු ජෙනරේටරයේ සහ වෙනත් යන්ත්‍ර වල වටිනාකම ද, පුස්තකාල පොත් 919ක වටිනාකම වූ රු.72,420ක් ද ගිණුම්වලින් අත්හැරී තිබුණි.

**(ආ) මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම**

ලැබිය යුතු මුද්දර ගාස්තු ඇස්තමේන්තුව රු.564,250ක් ද, ලැබිය යුතු බලපත්‍ර ගාස්තු ගිණුමේ ආරම්භක ශේෂය රු.713,033කින්ද, ආදායම් ණයගැති ගිණුමේ ආරම්භක ශේෂය රු.1,488,989කින්ද, වියදම් ණයහිමි ගිණුමේ ආරම්භක ශේෂය රු.310,433කින්ද, එකතු කළ අගය මත බදු ගිණුමේ ආරම්භක ශේෂය රු.430,000කින් හා සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂය රු.1,456,052කින් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.83,816,438ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.3 නොසැසඳූ ගිණුම්**

ගිණුම් විෂයන් 05කට අදාළ ශේෂයන්ගේ එකතුව රු.53,161,800ක් වූ අතර, ලේඛන වලට අනුව ශේෂයන්ගේ එකතුව රු.37,883,657ක් වූයෙන් රු.15,278,143ක වෙනසක් ගිණුම්වල දක්නට ලැබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.65,823,688ක් වූ අතර, එයින් අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු. 51,067,569ක් විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,804,547ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,204,986ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 79,035 | 18,026 | 61,009 |
| (ii) | බදු කුලී | 47,269 | 24,608 | 22,661 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,881 | 968 | 3,913 |
| (iv) | වෙනත් ආදායම් | 44,776 | 12,407 | 32,369 |

### 2.2.2 මුද්දර ගාස්තු

2012 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.4,000,000ක් විය.

### 2.2.3 කඩකාමර බදු

පුත්තලම බස් නැවතුම්පොල කඩ කාමර 23කින් අයවිය යුතුව පවතින රු.9,989,350ක් වසර ගණනාවක් තුල අයනොකර හිඟ හිටිව පැවත තිබුණි

## 2.3 හඳුනාගත් පාඩු

(අ) පොදු ගබඩාවෙහි පැවති රු.39,750ක් වටිනා GI පයිප්ප 13ක් හා බ්ලොක් ගල් 300ක් අස්ථානගත වීම නිසා සභාවට පාඩු සිදුවී තිබුණි.

(ආ) නගර සභාවට අයත් පුත්තලම මහජන පුස්තකාලයේ පැවති පොත් 156ක් නැති වීම හා පොත් 53ක් පාඨකයන් විසින් ආපසු ලබා නොදීම හේතුවෙන් රු.28,959ක පාඩුවක් සිදු වී තිබූ අතර එයින් රු.10,373ක මුදලක් අදාල පුස්තකාල සේවකයින්ගෙන් අයකරගෙන ඇති අතර, ඉතිරි රු.18,586ක මුදල සභාවට පාඩුවක් විය.

## 2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම රු.250,000ක් වූ HCM 99 අත් ට්‍රැක්ටරය වසර 12ක් කාලයක්ද, වටිනාකම ඇස්තමේන්තු කර නොමැති අංක 47-2853 දරණ කැන්ටර් රථය වසරක කාලයක් ද නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### (අ) අයවිය යුතු සේවක ණය

2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,643,975ක් විය. එයින් මිය ගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා ස්ථාන මාරුවී ගිය සේවකයින් 79 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ වටිනාකම රු.183,154ක් වසර 10කට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී හිඟ හිටිව පැවතුණි.

### (ආ) ලැබිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.119,954,352ක් වූ අතර, අවුරුදු 01ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.107,086,469ක් විය.

### (ඇ) නිරවුල් නොකළ අත්තිකාරම්

2001 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සභාවේ විවිධ කාර්යයන් සඳහා වියදම් දැරීම වෙනුවෙන් පුද්ගලයින් 18දෙනෙකු වෙත සභා අරමුදලින් ලබාදී තිබූ රු.544,838ක අත්තිකාරම් මුදල පියවාගෙන නොතිබුණි.

### (ඈ) අචල ජංගම වත්කම්

2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 05කටත් වඩා වැඩි කාලයක් තිස්සේ අචලව පවතින ජංගම වත්කම් 05ක වටිනාකම 4,365,278ක් විය.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2003 වර්ෂය වෙනුවෙන් එකතු කරගන්නා ලද ජාතිය ගොඩනැඟීමේ බදු දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත නියමිත දිනට ප්‍රේෂණය නොකර අත රඳවාගෙන තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ රු.21,681ක දඩ මුදල නගර සභාවට පාඩුවක්ව තිබුණි.

(ආ) වයඹ පළාත් මුල්‍ය රීති 120.1.2 ප්‍රකාරව 2004 හා 2006 වර්ෂයන්හි දී නිකුත් කරන ලද රු.539,886ක් වටිනා චෙක්පත් 07ක් අඟරු වී තිබුණි. එම අඟරු චෙක්පත් සඳහා මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) වයඹ පළාත් මුල්‍ය රීති 283 ප්‍රකාරව මාස 06ක් ඉක්මවා තිබූ වටිනාකම රු.249,357ක් වූ අංක 236195 සහ 2010 නොවැම්බර් 24 දිනැති චෙක්පත ආදායමට ගෙන නොතිබුණි.

(ඈ) 2010 මැයි 13 දිනැති වයඹ ප්‍රධාන ලේකම්ගේ අංක 5/3/මුදල් චක්‍රලේඛ/2010 චක්‍රලේඛය ප්‍රකාරව කල් ඉකුත් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු රු.23,558,286ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඉ) 1996 අංක 34 දරණ භාණ්ඩ හා සේවා බදු පනතේ විධිවිධාන අනුව වර්ෂ ගණනාවක සිට අයකර ගෙන තිබූ භාණ්ඩ හා සේවා බදු රු.1,209,068ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා අතරඳවා ගෙන තිබුණි.

(ඊ) නගර සභාව විසින් තම ව්‍යාපෘති සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය වාරික ආපසු ගෙවීම් දීර්ඝ ප්‍රමාදයන් තිබුණි.

(උ) 2006 වර්ෂයේ දී සේවයෙන් ඉවත් කිරීම හා වැටුප් නොගෙවීම මත නගර සභාවේ සේවකයින් දෙදෙනෙකු විසින් සභාවට එරෙහිව පවරා තිබූ වන්දි නඩුව අනුව රු.249,356.62ක වන්දියක් නගර සභාවට ගෙවීමට නියමිතව පැවති මුත්, එය නොගෙවා අත්හිටුවීම තුළ එම සේවකයින් විසින් ඊට එරෙහිව පුත්තලම මහාධිකරණය වෙත යොමු කර ඇති නඩුව 2012 දෙසැම්බර් 31 දින වන විටත්,

ක්‍රියාත්මක වන බැවින් වන්දි ගෙවීම පිළිබඳව නගර සභාවට අසම්භාව්‍ය බැරකමක් පැවත තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල කිසිදු සඳහනක් නොතිබුණි.

**2.7 අභ්‍යන්තර විගණනය**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය